සත්‍ය ගවේෂකයින්

රාවණා රජු සහ මිත්‍යාවෙන් යතාර්ථයට



කේ.පී.පී. හෂාන් දම්මික

රාමායනය සහ රාවණා රජු

රාවණ රජුගේ කථා පුවත අප බොහෝ දෙනා දැන ගන්නේ වාල්මිකී නම් පඬිවරයා ලියූ රාමයණය නමැති ග්‍රන්තයෙනි. රාවණ රජු සිටි බවත් ඔහු ලංකා පුරයේ රජකම් කල සක්විති රජ කෙනෙකු බවත්.ගොඩබිමින්,ගුවනින් මෙන්ම ජලයෙහි ගමන් කල හැකි තාක්ෂණයක් එකල තිබූ බවත්,සීතා නමැති කාන්තාවක් පැහැර ගෙන ඒම නිසා ඇති වූ යුද්ධය මත රාවණා රජුගේ සෙන්පතිවරුන්,මෙඝ නාද කුමරු,කුම්භකර්ණ ඇතුලු පිරිස සමග රාවණා රජු ඇතුලු පිරිස මියගිය බවත් විභීෂණ කුමරුගේ පාවා දීම සමග මේ සියල්ල සිදුවී අවසානයේ විභීෂණ කුමරුට රජකම බාරදී. රාම කුමරු ඉන්දියාවට ගිය බවත් සඳහන් වේ.

- රාවණ රජුගේ සත්‍ය මූලාශ්‍රය ලෙස රාමායනය පිළිගත හැකි ද?

රාමායනය යනු රාවණා රජු සිටි කාල යෙන් බොහෝ කලකට පසු ලියවුනු වීර කාව්‍යකි රාමායනය නේපාලය ,බුරුමය, තායිලන්තය, රුසියාව වැනි රටවල් වල පරිවර්ථණ කෘති ලෙසින් සම කාලීනව ලියවී ඇත.නමුත් රාමායනය කියවී මේ දී අපට හැගී යන්නේ අදහා ගත නොහැකි අත්භූත ක්‍රියාවලින් පිරුණු අතිශෝක්තියෙන් පිරුණු ග්‍රන්ථයක් ලෙසයි.

වාල්මිකී රාමායනය ලියන්නේ පක්ෂක් ග්‍රාහීව බවත් රාම කුමරු වීරයෙක් කිරීමට උවත් බොහෝ තැන් වලදී ඔහු විසින්ම රාවණා රජු රාමාට වඩා ශ්‍රේෂ්ඨ රජ කෙනෙකු බව බොහෝ තැන් වල දක්වා තිබේ. රාම රජු ස්ත්‍රී ලෝලියෙකු ලෙසත්, ලක්ශ්මණ කුමරු රාම කුමරුගේ ක්‍රියා අනුමත නොකල බවත්, ලක්ෂ්මන කුමරු සීතා කෙරෙහි ඇල්මක් තිබූ බවත් කියවේ. රාවණ රජු ඝාතනය කොට ඉන්දියාවට යන රාම කුමරු සීතා ප්‍රතික්ෂේප කිරීමත්, සීතා වන ගත වීමත්, රාම කුමරු සිය දිවි නසා ගැනීමත් සමග වීර කාව්‍ය අවසන් වේ. හොඳින් ග්‍රන්තය කියවන විට වැටහෙන්නේ රාම කුමරුට වීරත්වය ආරූඩ කොට එවකට ලංකාව හා ඉන්දියාවේ බොහෝ ප්‍රදේශ පාලනය කෙරූ රාවණා රජු දුශ්ඨයා කොට ගෙතූ ප්‍රබන්ධ කතාවක් බවයි.

නමුත් රාමායනය තුලින් එවකට පැවති රාවණ රාජධාණිය හා ස්ථාන පිළිබඳ පැහැදිලි විස්තර සඳහන් වන නිසානවතම ගවේශණ තුලින් රාවණ රජුට සම්බන්ධ කරුණු මතු වෙමින් පවතින නිසාත් රාමායනය මූලාශ්‍ර ග්‍රන්තයක් ලෙස එක හෙලා බැහැර කල නොහැක

- රාවණ රජු හා සම්බන්ඳ එකම මූලාශ්‍රය රාමායණයද?

රාමායණය ගෙන බැලූ විට එසේ හැගුනත්, රාවණ රජු පිළිබඳ ලියවුණු එක ම ග්‍රන්තය එය නොවේ. දිව්‍යාවදනයට අනුව කාශ්‍යප බුදුන්ගේ සමයේ ලංකාපුරයේ සිටි රාවණා රජුට කාශයප බුදුන් දම් දෙසූ බව සඳහන්වේ. තවද, විමාන ශාස්ත්‍ර (ගුවන්යානා පිළිබඳ කෘතිය) රාවණා රජුට අයත් බවත්, බ්‍රිතාන්‍ය ලංකාවෙන් පැහැරගෙන ගිය පුස්කොල පත් අතර රාවණා පුවත ඇතුලත් පුස්කොළපත් කීපයක් ඇති බව බ්‍රිතාන්‍යයේ ඇති ලංකා පුස්කොලපත් නාමාවලිය බැලූ විට පෙණී යයි. එවා නැවත ලංකාවට ලබා ගත හොත් ලංකා ඉතිහාසය නැවත ලිවීමට සිදු වන බව නොඅනුමානය.

රාවණ රජු හා සම්බන්ඳ ඉතිහාසයරාවණා රජුගේ රාජ්‍ය අදින් අවුරුදු 4000ත් 4500ත් අතර කාලයේ පැවති බවත් සම්මතයයි.නමුත් රාවණා රජුගේ හා කාශ්‍යප බුදුන් ගේ කාලය නිගමනය කල විට එය අදින් අවුරුදු 7500 කට එපිට බව මගේ පෞද්ගලික නිගමනය වේ.

රාවණා රජුගේ රාජධාණියත් රාවණ පුවතත් තව දුරටත් මිත්‍යාවක් නොවන බව මෙම කොටස අවසානයේ දී ඔබට වැටහෙනු ඇත.

~ සත්‍ය ගවේශකයන් ~

රාවණා රජු මිත්‍යාවක් ද?

රාවණා රජු මිත්‍යාවක් ද? නැද්ද යන්න පිළිබඳ මතය සෙවීමට පෙර රාවණා රජුගේ පරපුර සහ ඉතිහසය දැන ගැනීම අනිවාර්යයෙන් අවශ්‍යවේ මුලින්ම රාවණා රජු හා සම්බන්ද ඉන්දියාවේ මෙන් ම ලංකාවේ සාදක කිහිපයක් මෙසේ දක්වමි.



~ සත්‍ය ගවේශකයන් ~

රාවණා රජු සහ ගුවනින් ගිය හෙළයෝ

රාවණා රජු ඇතුලු හෙළයන් ගුවන්යානයේ නිර්මාතෘ වරුන් නොවන බව ඇතැම් අය පුන පුනා කියයි. නමුත් රාවණා රජු මෙන්ම ගොතම බුදුන්ගේ සමයේ සිටි සුමන රජුන් දක්වා ගුවන් යානා භාවිතා කොට ඇත.විවිද ආක්‍රමණ ඔස්සේ විනාශ වීම් මන්කොල්ල කෑම් සහ ඉතිහාස විකුර්තීන් මැද හෙළයන්ට ඉතිරි වූ මහා ඉතිහාසයෙන් බිඳක් සෙල්ලිපි තුලින් ඉදිරිපත් කරමි.





~ සත්‍ය ගවේශකයන් ~

රාවණා රජු ගේ පරපුර

කතරගම ධමරජ

↓

(කාල, යම) පෙළපත

ස්වයංභ නාරායන

↓

(ෂඩ්වංශ මනුවරු)

ස්වාරෝචිස් | උත්තම | තාමස | රෛවත | චාක්ෂුස | විවස්වත්සුත (සූර්ය පුත්‍ර)

- කාල්භගිනි (දුව)
- ධර්මරාජ(පුතා) (කාල,යම,පිතෘපති,යමකාල,අන්තක, වෛවස්වත යන නම් වලින් හැඳින්වේ.)

කාල්භගිනි (දුව) ↓

කාලභගිනි(බිරිඳ) (භයා,මහාභයා,මහබිය, යන නම් වලින්ද හැඳින්වේ) + හේති රාක්ෂස (සැමියා)

↓

විද්‍යුත්කේශ(පුතා) + සන්ධ්‍යාදුහිතෘ(බිරිඳ) (සාලකටංකටා යන නමින්ද හැඳින්වේ.)

↓

සුකේශ (පුතා) + දේවවතී(බිරිඳ)(ගාමිණී ගාන්ධර්වගේ දුව)

↓

පුතුන් තිදෙනා (ලංකාපුරයේ නිර්මාතෘවරු)

මාල්‍යවන්ත + සුන්දරී

i.වජ්‍රමුෂ්ටි
ii.විරූපාක්ෂ
iii.දුර්මුඛ
iv.සුප්තඝ්න
v.යඥකෝප
vi.මත්ත
vii.උන්මත්ත
viii.අනුලා(දුව)

සුමාලි + කේතුමතී

i.ප්‍රහස්ත
ii.අකම්පන
iii.විකට
iv.කාලිකාමුඛ
v.ධූම්‍රාක්ෂ
vi.දණ්ඩ
vii.සුපාර්ශ්ව
viii. සංහ්‍රාදි
ix.ප්‍රඝස
x.භාසකර්ණ
xi.පුෂ්පොත්කටා හෙවත් කෛකසී
xii.රකා හෙවත් රකි

මාලින් + වසුදා

i.අනල
ii.අනිල
iii.හර
iv.සම්පාති
v.මාලිනී

<u>රාවණා රජුගේ පිය පරපුර</u>

බ්‍රහ්මන්

↓

මානස පුත්‍ර ඍෂිවරු 7 කි.

→ i.රිචි ii.අත්‍රි iii.පුලහ iv.ක්‍රතු v.අංගිරස vi. වශිෂ්ඨ vii.පුලස්ති

↓

විශ්‍රවස් (පුතා)

පුෂ්පොත්කටා(බිරිඳ)

↓

i.කුම්භකර්ණ(පුතා)
ii.රාවණා(පුතා) + මන්දෝදරී(බිසව)

↓

i.මේඝනාද(පුතා) (ඉන්ද්‍රජිත්,අතිජිත්,රාවණී යන් නම් වලින් හැඳින්වේ.)
ii.ශොහිලි (දුව)

රකා (බිරිඳ)

↓

i.ඛර සහ දූෂණ(පුත්තු)
ii.සුපර්නිකා(දුව)

මාලිනී(බිරිඳ)

↓

විභීෂණ(පුතා) + සරමා(බිරිඳ)

ඉලා දේවී(බිරිඳ)

↓

කුවේර(පුතා)

උපුටා ගැනීම
සෙල්ලිපි කියවීමට නොදන්නා අයට
පහසු ක්‍රමයක් පිටු අංකය 17
(ශ්‍රී ලංකා රාවණා රාජධානිය සහ සීගිරි පුරාණය පිටුව 298)

~ සත්‍ය ගවේශකයන් ~

මිත්‍යාවෙන් එහා රාවණා රජුගේ සෙල්ලිපි

උපුටා ගැනීම දකුණු බුදු සිරිපතුල පිහිටි මක්කම සහ රාවණා රජුගේ සෙල්ලිපි
අභිලේඛණ විද්‍යා විශාරද පුරාවිද්‍යා ගවේශක ආචාර්ය ජයරත්න පතිර ආරච්චි මහතා

(3) මහරඣහ අමතෙ මකරහ ලෙණෙ
(මහ රජුගේ අමාත්‍ය මකරගේ ලෙන)[1]

(4) මහරඣහ අමතෙ මකරහ පුතහ ශොනහ ලෙණෙ
(මහරජුගේ ඇමැති වූ මකරගේ පුත්‍රයා වූ ශොනාගේ ලෙන)

8. "පරුමක විසව පුත පරුමක රවණ ලෙණෙ"
(ප්‍රධාන විශ්‍රවගේ පුත් වූ ප්‍රධාන රවණ ගේ ලෙණ)

11. "විසව පුත කුවෙර ලෙණෙ"

29) "විබිශන පුතහ කරනි ලෙණෙ මත කක ශි ලොචන යහ වළශල" විභීෂණගේ පුත්‍රයෙකු වන කරනි නැමැත්තෙකු ගැනත් මව වූ කකශි ලෝචනයහ වළශලය ගැන තොරතුරැක් සඳහන් වේ. තේරුම් කරදීම අපහට අපහසුය. මෙම ලිපිය තේරුම් කර ගැනීමට උගතුන් හට ඉඩ තබා අපි නිහඬ වෙමු.[29] විශ්ලේෂයෙන්

මිත්‍යාවෙන් එහා රාවණා රජුගේ සෙල්ලිපි

උපුටා ගැනීම දකුණු බුදු සිරිපතුල පිහිටි මක්කම සහ රාවණා රජුගේ සෙල්ලිපි

අභිලේඛණ විද්‍යා විශාරද පුරාවිද්‍යා ගවේශක ආචාර්ය ජයරත්න පතිර ආරච්චි මහතා

රවණවපියෙඉම කුවිරවිහරියට දිනි



"මහරකඩහ රවණ අගිනිදූතකහ ලෙණෙ ශගශ"[22]



"මහරකඩහ රවණ තොට බො කඩක ශුලහ ලෙණෙ ශගශ දිනෙ"

28) "රවණ පවත මත දශන"

රාවණාගේ මතාප දර්ශන පර්වත



"රවන අවරිය පුත පරුමක පුශ මිතහ ලෙණෙ ශගශ (ලාංඡනය) සිණි රකඩහ පුත පරුමක තශර ලෙණෙ ශගශ"

මිත්‍යාවෙන් එහා රාවණා රජුගේ සෙල්ලිපි

උපුටා ගැනීම දකුණු බුදු සිරිපතුල පිහිටි මක්කම සහ රාවණා රජුගේ සෙල්ලිපි

අභිලේඛණ විද්‍යා විශාරද පුරාවිද්‍යා ගවේශක ආචාර්ය ජයරත්න පතිර ආරච්චි මහතා

රාවණා රජුගේ පරපුර

පරුමක වීසව පුත රවණ ලෙණෙ
රාවණා රජුගේ පියතුමා

පරුමික රවණ සඩික ශොභිලි ලෙණෙ ශගශ
රාවණා රජුගේ දියණිය

මහරඣහ රවණ පුත පරුමක ඉඣු පුත පරුමක අගිය ලෙණෙ
රාවණා රජුගේ පුතාගේ පුතා

ඉන්දුජිත් ගේ පුත් අගියගේ ලිපිය (ප්‍රකට ය)

පරුමක අගිය පුත පරුමක කෙඩශ ලෙණෙ
අගිය ගේ පුත් තෙසඩශ

පරුමක අගිය පුත පරුමක තෙඣශ ලෙණෙ
අගියගේ පුත් තෙසඩශ (එම)

පරුමක තෙඣශ පුත පරුමක තිමිර
තෙසඩශගේ පුත් තිමිර

පරුමක තිමිර පුත පරුමක දිග ගුතශ
තිමිර ගේ පුත් දිගු ගුශය

පරුමක දිග ගුතශ පුත පරුමක බක තිශහ
දිග ගුතශගේ පුත් බක තිශය

පරුමක බක තිශහ පුත තිරිපලහ
බක තිශහගේ පුත් තිරිපලහ

රාවණා රජුගේ පරපුර

පූර්ව බුහ්ම හොහොත් පරුමිකවරු
ප රු මි ක ර ව ණ
ම හ ර ඣ හ රවණ

1. පරුමික රවණ සඩික ශොභිලි ලෙණෙ

රාවණ

පියා	- වීසව - (විශ්‍රව මුනිතුමා)	
පුතුයා	- ඉන්දුජිත්	
දියණිය	- ශොභිලි	
මුණුපුරු	- අගිය - පුත	
මී මුණුපුරු	- තෙසඩශ	
	- තිමිර	
	- දිග ගුතශ	
	- බක තිශහ	
	- සිරි පලහ	

පරපුර ඉවරයි - සිරිපලහගේ නාමය පසු පරුමික - පරුමික වී පරපුර අවසානයි.